# ශ්‍රීමාල් දැඩිගම
# Srimal Dedigama

33 | S | I

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්**
**General Certificate of Education (Ord. Level) Examination, December 2017**

**ඉතිහාසය** I
History I

**11 ශ්‍රේණිය**

සැලකිය යුතුයි
- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 1 - 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.

---

1. ශ්‍රී ලංකාව පිළිබඳ තොරතුරු ඇතුළත් ''ඉන්ඩිකා'' නමැති කෘතිය රචනා කරන ලද්දේ කවුරුන් විසින්ද?
   1. මෙගස්තිනීස් 2. ඇරිස්ටෝටල් 3. ටොලමි 4. ප්ලිනි

2. ප්‍රාග් ඓතිහාසික මානවයන්ගේ වාසස්ථානයක් ව පැවති අදින් වසර 38000 ක් පමණ වන එනම්, පැරණිම ගල්ගුහාව මින් කුමක්ද?
   1. කුරුවිට බටදොඹලෙන 2. කිතුල්ගල බෙලිලෙන
   3. අත්තනගොඩ අළුලෙන 4. බුලත්සිංහල පාහියන්ගල

3. ගොවියන් සඳහා වෙන් වූ ජනාවාසයක් හැඳින්වූයේ පහත සඳහන් කුමන නමකින්ද?
   1. පට්ඨානගාම 2. කසීකාරගාම 3. වඩ්ඪකීගාම 4. වාපිගාම

4. පරිපාලන දිස්ත්‍රික්ක වෙන්කොට ඒ එක් එක් දිස්ත්‍රික්ක පාලනය කිරීමට ඇමතිවරුන් පත් කිරීම සිදුවූයේ මින් කවර රාජ්‍ය සමයේදී ද?
   1. පණ්ඩුකාභය 2. දුටුගැමුණු 3. වසභ 4. භාතිකාභය

5. පැරණි ශ්‍රී ලංකාවේ විමධ්‍යගතව පැවති දේශපාලන බලය ප්‍රථම වරට වඩාත් ශක්තිමත් පදනමකින් මධ්‍යගත කරනු ලැබුවේ මින් කවර පාලකයකු විසින්ද?
   1. පණ්ඩුකාභාය රජු 2. දේවානම් පියතිස්ස රජු 3. දුටුගැමුණු රජු 4. I විජයබාහු රජු

6. රාජ්‍ය පරිපාලන සැකැස්මට අයත් වූ නිලධාරී තන්ත්‍රයේ, ව්‍යුහයේ නිවැරදි පිළිවෙල දක්වෙන්නේ මින් කවර පිළිතුරෙහිද?
   1. මපුරුමුකා, මහමත, අමෙත, බඩගරික 2. මපුරුමුකා, අමෙත, ශෙනපති, බඩගරික
   3. මහමත, අමෙත, මපුරුමුකා, බඩගරික 4. මපුරුමුකා, ශෙනපති, මහමත, බඩගරික

7. පහත ''අ'' තීරුවේ දක්වෙන ඓතිහාසික සිද්ධීන් හා බැඳුන රජවරු ''ආ'' තීරුවේ දක්වේ. ඒවා නිවැරදිව ගළපා ඇති පිළිතුර කුමක්ද?

| ''අ'' | ''ආ'' |
|---|---|
| i. ''නර ඉසර'' ලෙස තමාව හඳුන්වා ගැනීම | A පළමුවන විජයබාහු රජු |
| ii. චෝළ පාලනයෙන් රට මුදා ගැනීම | B පණ්ඩුකාභය රජු |
| iii. පත්තිනි දේවාලය විවෘත කිරීමට චේර රාජ්‍යයට යාම | C කුට්ඨකණ්ණතිස්ස රජු |
| iv. දිවයිනේ ග්‍රාමසීමා සටහන් කිරීම හා සොත්ති ශාලා ඉදිකරවීම | D මහා පරාක්‍රමබාහු රජු |
| | E පළමුවන ගජබාහු රජු |

   1. ACEB 2. CAEB 3.CDBE 4.DACB

8. සැත්කම් සඳහා භාවිතා කරන ලද ඉතා පැරණි ලෝහමය කතුරු කිහිපයක් සොයා ගන්නා ලද්දේ,
   1. අභයගිරි විහාර සංකීර්ණයෙනි 2. අලාහන පිරිවෙන් සංකීර්ණයෙනි
   3. දැදිගම කොටවෙහෙර සමීපයෙනි 4. ජේතවන කැණීම් වලිනි

9. ශ්‍රී පාදස්ථානය බෞද්ධ, හින්දු, ඉස්ලාම් බැතිමතුන්ගේ වන්දනාමානයට ලක්වීමෙන් අනාවරණය වන වැදගත්ම ලක්ෂණය වන්නේ, අතීත සමාජයේ....
   1. කැමති ආගමක් ඇදහීමට නිදහස තිබූ බව යි. 2. ආගමික සහජීවනයක් පැවති බව යි.
   4. ශ්‍රී පාදස්ථානය සියලු බැතිමතුන්ගේ ගෞරව ආදරයට ලක්වූ බව යි. 3. විවිධ ජාතීන් විවිධ ආගම් ඇදහූ බව යි.

10. පහත සිදුවීම් සම්බන්ධ වරායන් යුගලය නම් කරන්න.

A පර්සියානු වෙළඳුන් රැඳීසිටි බව කොස්මස් විසින් සඳහන් වරාය

B හේමමාලා දන්ත කුමරු පැමිණි බව සඳහන් වරාය

1. මහාතිත්ථ හා ලංකා පටුන  2. දඹකොළ පටුන හා කාලතිත්ථ
3. දඹකොළ පටුන හා ලංකා පටුන  4. කාලතිත්ථ හා මහාතිත්ථ

11. පහත සපයා ඇති ඓතිහාසික තොරතුරු අතුරින් පළමුවන විජයබාහුට හා නිශ්ශංකමල්ල රජුට සම්බන්ධ තොරතුරු පමණක් ඇතුළත් පිළිතුර කුමක්ද?

A පොළොන්නරුව පාලන මධ්‍යස්ථානය ලෙස තෝරා ගැනීම

B දළදා මාළිගයේ ආරක්ෂාවට වේලෙක්කාර හමුදාව පත් කිරීම

C පළාත් බද රෝහල් පිහිටුවා අවශ්‍ය පහසුකම් ලබා දීම

D තුලාභාර දන් දීම සඳහා කටයුතු කිරීම

1. A හා B ය.  2. A හා D ය.  3. B හා C ය.  4. B හා D ය.

12. පහත ''අ'' තීරුව, ''ආ'' තීරුව හා සමග ඇති සම්බන්ධතාව නිවැරදිව ගළපා ඇති පිළිතුර කුමක්ද?

| "අ" | "ආ" |
|---|---|
| i. දියුණු වෛද්‍ය තාක්ෂණයක් පැවතීම | A සමනල වැව |
| ii. යකඩ නිස්සාරණය කළ බව අනාවරණය වීම | B බලංගොඩ |
| iii. මැටි ඔරු සුසානවල භෂ්මාවශේෂ තැන්පත් කිරීම | C ආලාහන පිරිවෙන |
| iv. විශාල ඉදිකිරීම සඳහා ශක්තිමත් පාදමක් යොදා ගැනීම | D රුවන්වැලි සෑය |
| | E රංචාමඩම |

1. ABEC  2. BACD  3. CAED  4. CBAD

13. පහත දැක්වෙන ප්‍රකාශ අතරින් සාවද්‍ය ප්‍රකාශය කුමක්ද?

1. නිසි කලට සී සෑම නොකරන පුද්ගලයන්ට කළං පහක දඩයක් අයකරන ලද බව - කොණ්ඩවට්ටාවාන් ටැම් ලිපිය.
2. නිලධාරීන්ට නොපෙන්වා එම වෙළඳපොලේ භාණ්ඩ විකුණන අයගෙන් දෙගුණයක් බදු අයකරන ලද බව - බදුල්ල ටැම් ලිපිය.
3. අන්සතු හරක් හොරකම් කොට අසුවුවහොත්, හරකුන් හිමිකරුට ලබාදී හරකුන්ගේ ශරීරවල තිබූ මුද්‍රාව නළලේ තබන බව - වේවැල්කැටිය සෙල්ලිපිය.
4. කැලෑවල ගස්කොළන් නොකැපිය යුතු බව හා වනසතුන් නොමැරිය යුතු බව - මිහින්තලා පුවරු ලිපිය.

14. පහත දැක්වෙන තොරතුරුවලට අදාල රජවරුන් දෙදෙනාගේ නම් සඳහන් පිළිතුර තෝරන්න.

- චන්ද්‍රභානු ජාවකගේ ආක්‍රමණයන්ට මුහුණ දීම.
- දේව පතිරාජ ඇමතිවරයා යොදවා ආර්ථික හා ආගමික සංවර්ධනය සිදු කිරීම.
- ඊජිප්තුවේ සුල්තාන් වෙත තානාපතිවරු පිරිසක් යැවීම.
- කාලිංගරායර්ගේ ආක්‍රමණයන්ට සාර්ථකව මුහුණ දීම.

1. තුන්වන පරාක්‍රමබාහු හා දෙවන බුවනෙකබාහු  2. දෙවන පරාක්‍රමබාහු හා පළමුවන බුවනෙකබාහු
3. දෙවන පරාක්‍රමබාහු හා දෙවන බුවනෙකබාහු  4. තුන්වන විජයබාහු හා තුන්වන පරාක්‍රමබාහු

15. ''අ'' තීරුවේ දැක්වෙන ඓතිහාසික සිද්ධි ''ආ'' තීරුවේ රාජධානි සමග ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක්ද?

| "අ" | "ආ" |
|---|---|
| i. ඉබන් බතුතාගේ පැමිණීම | A දඹදෙණිය |
| ii. චන්ද්‍රභානුගේ ආක්‍රමණ | B කුරුණෑගල |
| iii. පාණ්ඩ්‍ය හමුදාව දළදාව පැහැර ගැනීම | C ගම්පොළ |
| iv. දළදා පූජාවලිය රචනා කිරිම | D කෝට්ටේ |
| | E යාපහුව |

1. ACEB  2. CABD  3. BACD  4. CAEB

16. පහත දැක්වෙන ඓතිහාසික සිද්ධි සිදුවූ අනුපිළිවෙල නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක්ද?

A වැලිවිට සරණංකර හිමියන්ට සංඝරාජ තනතුර පිරිනැමීම.

B පෘතුගීසින් මෙරටින් පලවා හැරීම.

C දෙල්ගමුව විහාරයේ සඟවා තිබූ දන්ත ධාතුව මහනුවරට වැඩම කරවීම.

D ඇම්බැක්කේ දේවාලය කරවීම.

1.ACDB 2.CDBA 3.DCAB 4.DCBA

17. නූතන රන්කරුවාට පවා අභියෝගයක් වූ මල්කැටයම් 21 ක් සහිත වී ඇටයක ප්‍රමාණයේ තැල්ලක කොටසක් හමුවූයේ,

1. අභයගිරි කැණීම් වලිනි
2. ජේතවන කැණීම් වලිනි
3. අලාහන පිරිවෙන කැණීම් වලිනි
4. රුවන්වැලිසෑය කැණීම් වලිනි

18. ජෝන් වයික්ලිප්, ජෝන් හස්, ඉරාමස්, මාටින් ලූතර් වැන්නන් පුනරුද සමයේදී වඩාත් ප්‍රසිද්ධ වූයේ කුමන කරුණක් උදෙසාද?

1. භාෂාව හා සාහිත්‍ය දියුණුව උදෙසා කටයුතු කිරීම නිසාය.
2. චිත්‍ර හා මූර්ති කලාවේ උන්නතිය සඳහා කැපවීම නිසාය.
3. පල්ලියේ ආධිපත්‍ය විවේචනය කිරීම නිසාය.
4. විශ්වය පිළිබඳ නව මතයක් ඉදිරිපත් කිරීම නිසාය.

19. ලංකාව ආක්‍රමණය කර මෙරටින් රැගෙන ගිය දන්ත ධාතුන් වහන්සේව යළි ශ්‍රී ලංකාවට වැඩම කරවූයේ කුමන රජුද?

1. IIවන පරාක්‍රමබාහු 2. Iවන බුවනෙකබාහු 3. IIවන බුවනෙකබාහු 4. IIIවන පරාක්‍රමබාහු

20. යාපනයේ පාලකයා වූ සංකිලි රජු හා පෘතුගීසීන් අතර ගැටුම් ඇතිවීමට බලපෑ මුල්ම හේතුව වූයේ මින් කුමක්ද?

1. පෘතුගීසීන්ට වෙළඳ භාණ්ඩ ලබා නොදීම.
2. උඩරට රජුගේ වෙළඳ කටයුතු වලට යාපනය පාලකයා සහය දීම.
3. සංකිලි රජු කප්පම් ගෙවීම පැහැර හැරීම.
4. පෘතුගීසීන්ගේ වෙළඳ නැව් වලට බාධා එල්ල වීම.

21. පහත ''අ'' තීරුවේ සඳහන් වන සටන් ''ආ'' තීරුවේ ඇති පෘතුගීසි නායකයන්ට අදාළව නිවැරදිව ගළපා ඇති පිළිතුර තෝරන්න.

| ''අ'' | ''ආ'' |
|---|---|
| i. දන්තුරේ | A කොන්ස්තන්තීනු ද සා |
| ii. රන්දෙණිවල | B දියෝගෝ ද මේලෝ |
| iii. ගන්නොරුව | C පේරෝ ලෝපේස් ද සූසා |
| iv. මුල්ලේරියා සටන | D අපොන්සු පෙරෙයිරා ද ලසර්දා |
| | E ජෙරනිමෝ ද අසවේදු |

1. CABD 2. CBDA 3. DABE 4. EBCD

22. ගල් අඟුරු කර්මාන්තය හා සම්බන්ධ නව සොයාගැනීම් කළ පුද්ගලයින් දැක්වෙන පිළිතුර කුමක්ද?

A හම්ප්‍රි ඩේවි B ගුග්ලි මාර්කෝනි C ජෝන් කේ

D ජේම්ස් වොට් E ඒබ්‍රහම් ඩර්බි

1. A හා C ය. 2. A හා D ය. 3. C හා B ය. 4. D හා F ය.

23. කාර්මික විප්ලවයේ බලපෑමට ශ්‍රී ලංකාව නතු වූ ප්‍රධාන සාධකය වන්නේ,

1. වතුවගාවන් ආරම්භ වීම ය.
2. බ්‍රිතාන්‍ය යටත් විජිතයක් වීම ය.
3. කෝපි මෝලක් ආරම්භ වීම ය.
4. මහා මාර්ග ඉදි කිරීම ය.

24. පහත සඳහන් සිදුවීම් ඓතිහාසික පිළිවෙලින් පෙළගැස්සවූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

A ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය කිරීටයේ යටත් විජිතයක් වීම.

B ඓතිහාසික උඩරට ගිවිසුම අත්සන් කිරීම.

C ජෝන් ඩොයිබස් උඩරට පැමිණීම.

D ඉංග්‍රීසීන් ත්‍රිකුණාමල වරාය යටත් කර ගැනීම.

1. ADCB 2. BCAD 3. CABD 4. CDAB

25. - අනගාරික ධර්මපාලතුමා - වලිසිංහ හරිස්චන්ද්‍රතුමා
- පියදාස සිරිසේන මහතා - ජෝන් ද සිල්වා මහතා

පුනරුද ව්‍යාපාරයේදී ඉහත සඳහන් පුද්ගලයන් ක්‍රියා කළ ආකාරය පිළිබඳ දිය හැකි පොදු නිගමනය කුමක්ද?

1. බෞද්ධ පූජනීය ස්ථාන ආරක්ෂා කිරීමට කටයුතු කිරීම.
2. දේශානුරාගය හා ජාත්‍යාලය වර්ධනය කිරීම.
3. නාට්‍ය මගින් ජනතාව තුළ දේශානුරාගය ඇති කිරීම.
4. බෞද්ධ පොත් පත් රචනා කිරීම තුළින් ආගමික නැඹුරුවක් ඇති කිරීම.

- පහත දැක්වෙන වගුවේ A සිට J දක්වා දී ඇති තොරතුරු ඇසුරින් 26 හා 27 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| වර්ෂය | බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරු | වැදගත් සිද්ධීන් |
|---|---|---|
| A 1815 | D ටොරිංටන් සාමි | G කෝල්බෲක් ප්‍රතිසංස්කරණ |
| B 1833 | E රොබර්ට් බ්‍රවුන්රිග් | H දිවයින නිල වශයෙන් යටත්වීම |
| C 1848 | F එඩ්වර්ඩ් බාර්න්ස් | J දෙවන නිදහස් සටන |

26. උඩරට ගිවිසුම හා සම්බන්ධ තොරතුරු පමණක් ඇතුලත් පිළිතුර කුමක්ද?
1. ADJ 2. AEH 3. BEG 4. CFH

27. බ්‍රිතාන්‍ය රජයේ නව බදු ප්‍රතිපත්තීන් හා සම්බන්ධ තොරතුරු පමණක් ඇතුළත් පිළිතුර කුමක්ද?
1. AEH 2. BEJ 3. CDJ 4. CEJ

28. ක්‍රි.ව. 1908 වර්ෂයේදී මුළු දිවයිනටම බලපාන අයුරින් කොන්දේසි මාලාවක් ඉල්ලා සිටි මධ්‍යම පන්තිය වෙනුවෙන් පෙනී සිටි නායකයා වූයේ,
1. පොන්නම්බලම් රාමනාදන් මහතා ය. 2. පොන්නම්බලම් අරුණාචලම් මහතා ය.
3. ආරුමුග නාවලර් මහතා ය. 4. ශ්‍රීමත් ජේම්ස් පීරිස් මහතා ය.

29. පහත දැක්වෙන පාසල් අතුරින් ආරුමුග නාවලර් තුමා විසින් පිහිටුවන ලද පාසල් දෙක ඇතුලත් පිළිතුර කුමක්ද?
A ශෛව ප්‍රකාශ විද්‍යාලය B සහිරා විද්‍යාලය C හින්දු විද්‍යාලය D මද්රසා පාසල්

1. A හා B ය. 2. A හා C ය. 3. B හා C ය. 4. C හා D ය.

30. කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණ මගින් ඉදිරිපත්වූ යෝජනා ඇතුළත් පිළිතුර කුමක්ද?
A ද්විත්ව පාලනය අහෝසි කිරීම B පලාත්බද නියෝජන ක්‍රමය හඳුන්වා දීම
C අනිවාර්ය සේවා රාජකාරී ක්‍රමය අහෝසි කිරීම D ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීම

1. A හා B ය. 2. A හා D ය. 3. B හා C ය. 4. C හා D ය.

- පහත සඳහන් A සිට E දක්වා සපයා ඇති තොරතුරු අධ්‍යයනය කර ප්‍රශ්න අංක 31 හා 32 ට පිළිතුරු සපයන්න.

A ලංකාව යනුවෙන් හැඳින්වූ රට ශ්‍රී ලංකාව යනුවෙන් හැඳින්වීම
B විධායක ජනාධිපති ධූරය ඇති කිරීම C සෙනට් සභාව හඳුන්වාදීම
D සමානුපාතික නියෝජන ක්‍රමය හඳුන්වා දීම E ප්‍රථම වරට ජනමත විචාරණ ක්‍රමය හඳුන්වා දීම

31. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අදාළ ලක්ෂණ පමණක් දැක්වෙන පිළිතුර කුමක්ද?
1. A හා B ය. 2. A හා C ය. 3. A හා E ය. 4. C හා D ය.

32. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අදාළ ලක්ෂණ ඇතුළත් පිළිතුර කුමක්ද?
1. A හා B ය. 2. A හා E ය. 3. B හා C ය. 4. B හා D ය.

33. ''අ'' තීරුවේ දැක්වෙන වැවිලි බෝග ''ආ'' තීරුවේ දැක්වෙන පර්යේෂණ මධ්‍යස්ථාන සමග නිවැරදිව ගළපා ඇති පිළිතුර තෝරන්න.

| ''අ'' | ''ආ'' |
|---|---|
| i. තේ | A අගලවත්ත |
| ii. පොල් | B ලුණුවිල |
| iii. රබර් | C මාතලේ |
| iv. සුළු අපනයන බෝග | D තලවකැලේ |
| | E බතලගොඩ |

1. ACBD  2. BCAE  3. DBAC  4. DBEC

- පහත දැක්වෙන වගුවේ A සිට J දක්වා දී ඇති තොරතුරු ඇසුරින් 35 හා 36 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| වර්ෂය | වැදගත් සිදුවීම | ඒ වන විට රාජ්‍ය නායකයා |
|---|---|---|
| A 1948 | D රාජ්‍ය මන්ත්‍රණ සභා | G ඩී.එස්.සේනානායක මහතා |
| B 1972 | E ලංකා ස්වාධීනතා පනත බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව විසින් සම්මත කිරීම | H ජේ.ආර්. ජයවර්ධන මහතා |
| C 1978 | F සමානුපාතික නියෝජන ක්‍රමය | J සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය |

34. ශ්‍රී ලංකාවට නිදහස ලැබීම හා සම්බන්ධ තොරතුරු ඇතුලත් පිළිතුර කුමක්ද?
1. ADG  2. AEG  3. AEH  4. CDJ

35. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ඇතිවූ මුල්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධ තොරතුරු ඇතුළත් පිළිතුර කුමක්ද?
1. AFG  2. BDJ  3. BEJ  4. CFH

36. කාර්මික විප්ලව සමයේ ගල් අඟුරු යොදාගෙන යපස් උණු කිරීමේ ක්‍රමය සොයාගත්තේ කවුද?
1. සැමුවෙල් ක්‍රොම්ප්ටන්  2. හම්ප්‍රිඩේවි  3. ඒබ්‍රහම් ඩර්බි  4. ජෝන් කේ

37. පහත A සිට E දක්වා තොරතුරු අතුරින් රුසියන් විප්ලවය හා ඇමරිකන් විප්ලවයට අදාල තොරතුරු පමණක් ඇතුළත් පිළිතුර කුමක්ද?

A ටෙනිස් පිටියේ දිවුරුම  B බොස්ටන් තේ සාදය
C ප්‍රථම සමාජවාදී රාජ්‍යය බිහිවීම  D බැස්ටීලයට පහර දීම
E පෞද්ගලික ඉඩම් අයිතිය අහෝසි කිරීම

1. A හා B ය.  2. A හා D ය.  3. B හා E ය.  4. C හා D ය.

38. ප්‍රථම ලෝක සංග්‍රාමය හා සම්බන්ධ පහත A සහ B ප්‍රකාශ අධ්‍යයනය කොට නිවැරදි පිළිතුර තෝරන්න.
A ඇල්සාර්ස්, ලොරෙන්ස් ප්‍රශ්නය  B පර්ල් වරායට බෝම්බ හෙලීම
1. A හා B සත්‍ය වේ  2. A සත්‍ය වන අතර, B අසත්‍ය වේ
3. A අසත්‍ය වන අතර, B සත්‍ය වේ  4. A හා B අසත්‍ය වේ

39. එක්සත් ජාතීන්ගේ සංගමය හා සම්බන්ධ පහත A සහ B ප්‍රකාශ අධ්‍යයනය කොට නිවැරදි පිළිතුර තෝරන්න.
A සූවස් අර්බුදය  B ඉතාලිය ඇබිසීනියාව ආක්‍රමණය කිරීම
1. A හා B සත්‍ය වේ  2. A සත්‍ය වන අතර, B අසත්‍ය වේ
3. A අසත්‍ය වන අතර, B සත්‍ය වේ  4. A හා B අසත්‍ය වේ

40. බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාවේ වැවිලි බෝග වගාව ව්‍යාප්ත කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් මෙරට ජනතාවට මුහුණපෑමට සිදුවූ ප්‍රබලම ගැටලුවක් ලෙස සැලකිය හැක්කේ,

1. සාම්ප්‍රදායික ස්වයංපෝෂිත ආර්ථික ක්‍රමය බිඳ වැටීම.  2. ඉඩම් අහිමි ජනතාවක් බිහිවීම.
4. ගම් සභාව වැනි ප්‍රයෝජනවත් ආයතන විනාශ වීම.  3. කඳුකර ප්‍රදේශවල වනාන්තර විනාශ වීම.

33 S II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
General Certificate of Education (Ord. Level) Examination, December 2017

ඉතිහාසය II
History II

11 ශ්‍රේණිය

සැලකිය යුතුයි

- **I කොටසේ පළමුවන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.**
- **II කොටසින් ප්‍රශ්න හතරකට ද, III ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.**

---

## I කොටස

1. (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද (ii) යටතේ දක්වා ඇති ස්ථාන සයල්ල ම, සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.

(i) කලාඔය, දැදුරු ඔය, මිනිහාගල්කන්ද, දඹකොළපටුන, දේවනගර, මිනිපේ අමුණ, පරාක්‍රම සමුද්‍රය, මාතලේ, මහාතිත්ත, ගාල්ල, සල්වතොට, ඉරණමඩු, ලංකා පටුන, නාගදීපය, කෝට්ටේ, යාපහුව, නාච්චදුව වැව, තිස්සමහාරාමය

(ii) රතු මුහුද, මහා බ්‍රිතාන්‍යය, රෝමය, තායිවානය, ගෝව, කල්කටාව, ජපානය, සිංගප්පූරුව, පර්සියන් බොක්ක, ක්‍රිෂ්ණ නදිය

(ආ) (i) පහත A,B,C,D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයන් කවුරුන්දැයි පිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A - ඓතිහාසික මූලාශ්‍රයයන් හි සඳහන් වන "උත්තිය " නම් තෙරුන් වහන්සේලාට සිය ශ්‍රාතින් වස්කාලය ගත කිරීමට "වස්වාසික සාථක" පූජා කළ බව සඳහන් වන සෙල් ලිපිය කුමක් ද?

B - දකුණු ඉන්දීය කුලී හමුදාවේ සහාය ලබාගත් මෙරට මුල්ම පාලකයා

C - ඉස්ලාම් පුනරුද ව්‍යාපාරයේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා ඊජිප්තුවේ සිට ශ්‍රී ලංකාවට පැමිණි ඉස්ලාම් භක්තිකයා

D - ශුද්ධ වූ මහම්මත්තුමන් ජීවමානව සිටින කාලයේ උන්වහන්සේගේ ධර්මය කුමක්දැයි දැන ගැනීමට සෙරන්ඩිබ් වලින් කණ්ඩායමක් අරාබියට පැමිණි බව සඳහන් වන කෘතිය කුමක් ද?

- A හා B යටතේ දක්වා ඇති රූප අධ්‍යයනය කොට, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක පිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

(ii) 1. A රූපය නම් කරන්න.
2. මෙය සොයා ගත් ස්ථානය කුමක් ද?
3. මෙම නිර්මාණය සඳහා යොදා ගෙන ඇති මාධ්‍ය කුමක් ද?
4. මෙම නිර්මාණය සඳහා යොදා ඇති උපකරණය කුමක ද?



A රූපය



B රූපය

(iii) 1. B රූපයේ දැක්වෙන පුද්ගලයා නම් කරන්න.
2. මොහු කුමන රටක පාලකයා වී ද?
3. මොහු හඳුන්වා දුන් දේශපාලන දර්ශනය කුමක් ද?
4. දෙවන ලෝක සංග්‍රාමයට පෙර ඔහු විසින් රචනා කළ ග්‍රන්ථය කුමක් ද?

## II කොටස

02. (i) ශ්‍රී ලංකාව සම්බන්ධ තොරතුරු ඉදිරිපත් කර ඇති (A) චීන (B) පෘතුගීසි (C) අරාබි ලේඛකයන් තිදෙනෙක් නම් කරන්න.

(ii) සාහිත්‍ය මූලාශ්‍රය භාවිත කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හතරක් සඳහන් කරන්න.

(iii) මුල් ඓතිහාසික යුගයේ ජනාවාසවල ව්‍යාප්තියට බලපෑ සාධක දෙකක් විස්තර කරන්න.

(iv) මුල් ඓතිහාසික යුගයේ ජනාවාසවල ස්වරූපය කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න.

03. (i) පහත සඳහන් වෘත්තින්වලට අදාල ගම් නම් කරන්න.

A ධීවර B ගොවියන් C වළං සෑදීම

(ii) පහත සඳහන් පාලකයන්ට අදාළ රාජ්‍යත්ව සංකල්ප A, B, C සහ D පිළිවෙලින් ලියා දක්වන්න.

A - කාශ්‍යප B - මහසෙන් C- කුඨකණ්ණතිස්ස D - නිශ්ශංකමල්ල

(iii) පළමු වන විජයබාහු රජතුමා මෙරට ඉතිහාසයේ ශ්‍රේෂ්ඨ පාලකයෙකු බව කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න.

(iv) පැරණි ශ්‍රී ලාංකික සමාජය වාර්ගික සහජීවනයෙන් කටයුතු කළ බව උදාහරණ තුනක් ඇසුරින් පැහැදිලි කරන්න.

04. (i) පහත දැක්වෙන උපාංගවලින් ඉටුවෙන කාර්යයන් නම් කරන්න.

A - සළපතාව B - සොරොව්ව C - බිසෝකොටුව

(ii) පහත සඳහන් තොරතුරුවලට අදාළ පිළිතුරු ABCD පිළිවෙලින් දක්වන්න.

A - පදම් කළ මැටිවලින් භාණ්ඩ සාදා ගැනීමට යොදාගත් උපකරණය

B - උස් ගොඩනැගිලි අකුණු අනතුරුවලින් වළක්වා ගැනීමට සැකසූ තාක්ෂණික මෙවලම

C - අචල ජල විද්‍යා මූලධර්මයට අනුව ස්වයංක්‍රීයව තෙල් පාලනය සිදු වීම

D - මයිනහමක ආධාරයෙන් යකඩ නිස්සාරණය කළ බවට සාධක

(iii) ශ්‍රී ලංකාවේ පැරණි සමාජය පරිසර සම්පත් සංරක්ෂණය කිරීමේ දී අපද්‍රව්‍ය බැහැර කිරීම පිළිබඳව අවධානය යොමුකළ බව නිදසුන් දෙකක් ඇසුරින් විස්තර කරන්න.

(iv) පැරණි දේශීය ආහාර පරිභෝජන රටාව සෞඛ්‍ය සම්පන්න ජනතාවක් බිහිකිරීමට ඉවහල් වූ අයුරු කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න.




05. (i) දෙවන නාගරිකරණ අවධියේ වූ නාගරික නාගරික ජනාවාස තුනක් යාබද ලංකා සිතියමේ A.B හා C ලෙස දක්වා ඇත. ඒවා පිළිවෙළින් නම් කරන්න.

(ii) පහත A සිට D දක්වා ඇති ඓතිහාසික සිද්ධිවලට සම්බන්ධ රජවරුන් වරහන් තුළ දක්වා ඇති නම් අතුරින් තෝරා පිළිවෙළින් ලියා දක්වන්න.

A- පන්සිය පනස් ජාතක පොත සිංහලයට පරිවර්තනය කිරීම.

B - කෝට්ටේ මේ රජධානිය ඇරඹීම.

C - අම්බුළුගල කුමරු යවා සිංහල සංගය කැරැල්ල මැඩ පැවැත්වීම.

D- දන්ත ධාතුව ලංකාවට වැඩමවීම

(පළමුවන බුවනෙකබාහු, දෙවන බුවනොකබාහ, හයවන බුවනොකබාහු, දෙවන පරාක්‍රමබාහු, තුන්වන පරාක්‍රමබාහු, සිව්වන පරාක්‍රමබාහු, පස්වන පරාක්‍රමබාහු, සයවන පරාක්‍රමබාහු)

(iii) හයවන පරාක්‍රමබාහු රජතුමාගේ රාජ්‍ය පාලන කාලය ලංකා ඉතිහාසයේ වැදගත් යුගයක් ලෙස සැලකිය හැක්කේ ඇයි දැයි කරුණු දෙකක් ආශ්‍රයෙන් විස්තර කරන්න.

(iv) දෙවන නාගරීකරණ අවධියේ මෙරට ආර්ථික රටාවේ හා ගෘහ නිර්මාණ යන ක්ෂේත්‍ර වල ඇති වූ වෙනස්කම් කරුණු 03 ක් යටතේ පැහැදිලි කරන්න.

06. (i) ABC වලට අදාළ පිළිතුර ලියන්න.

(A) කියු ලිපිය ලැබෙනවිට මෙරට උඩරට රජු කවු ද?

(B) පළමුවරට ලංකාවට පැමිණි ඉංග්‍රීසි දූතයා කවුද?

(C) බ්‍රිතාන්‍යයන් විසින් ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශය කිරීටයේ පාලනයට යටත් කරගත් වර්ෂය කුමක් ද?

(ii) පහත A,B, C සහ D යටතේ දක්වා ඇති තොරතුරුවලට අදාළ පුද්ගලයන් පිළිවෙළින් ලියා දක්වන්න.

A - ශ්‍රී ලංකාවේ අවසන ලන්දේසි ආණ්ඩුකාරවරයා

B - ජොන් ඩොයිලිට සිංහල භාෂාව ඉගැන්වූ බෞද්ධ භික්ෂූන් වහන්සේ

C - ක්‍රි.ව. 1797 කැරැල්ල පිළිබඳ සොයා බැලීමට පත්කළ කොමිසමේ නායකයා.

D - ක්‍රි.ව. 1803 දී උඩරට ආක්‍රමණයට ඉංග්‍රීසි හමුදාවේ නායකයා

(iii) 1818 ඌව වෙල්ලස්ස නිදහස් අරගලය අසාර්ථක වීමට තුඩුදුන් හේතු දෙකක් විස්තර කරන්න.

(iv) ක්‍රි.ව. 1848 දී බ්‍රිතාන්‍යයන්ට එරෙහිව ඇති වූ දෙවන නිදහස් සටනට හේතු වූ කරුණු දෙකක් පැහැදිලි කරන්න.

07. (i) ABC වලට අදාල පිළිතුරු ලියන්න.

A - 1947 වර්ෂයේ සිට මෙරටට නාමික විධායකය ලෙස හැඳින්වුයේ කවුරුන් ද?

B - 1972 I ජනරජය ව්‍යවස්ථාවට අනුව ව්‍යවස්ථාදායකය හැඳින්වූ නම

C - සෙනෙට් සභාවෙන් අනිවාර්යෙන්ම තේරී පත්විය යුතු අමාත්‍යංශය කුමක් ද?

(ii) පහත A.B.C සහ D වලින් දැක්වෙන තොරතුරුවලට අදාළ පිළිතුරු පිළිවෙළින් ලියා දක්වන්න.

A - ශ්‍රී ලංකාවේ ප්‍රථම විධායක ජනාධිපතිවරයා.

B - 1946 පැවැති මැතිවරණයෙන් ජය ගත් දේශපාලන පක්ෂය කුමක් ද?

C - 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 වන වගන්තියෙන් ප්‍රථම වරට හඳුන්වාදුන්නේ කුමක් ද?

D - දිවයිනේ උත්තරීතර හා අවසාන අධිකරණයේ ප්‍රධානියා වන්නේ කවුද ?

(iii) නිදහසින් පසු ශ්‍රී ලංකාවේ වී වගාව නංවාලීම සඳහා රජය විසින් අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග දෙකක් විස්තර කරන්න.

(iv) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හඳුන්වාදුන් නව විධි විධානයන් උදාහරණ 3 ක් ඇසුරින් පැහැදිලි කරන්න.

08. (i) ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය යටත් විජිතයක් වීමට පෙර මුහුදුබඩ ප්‍රදේශවල ගෙනගිය පාලන ක්‍රම තුන අනුපිළිවෙළින් ලියා දක්වන්න.

(ii) බ්‍රිතාන්‍ය පාලනයට එරෙහිව ක්‍රි.ව. 1848 දෙවන නිදහස් සටනට බලපෑ හේතු හතරක් සඳහන් කරන්න.

(iii) බෞද්ධ පුනර්ජීවය උදෙසා අනගාරික ධර්මපාලතුමා ගන්නා ලද ක්‍රියා මාර්ග දෙකක් පැහැදිලි කරන්න.

(iv) ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේ ප්‍රධාන ලක්ෂණ තුනක් සඳහන් කර පැහැදිලි කරන්න

09. (i) විසිවන සියවස ආරම්භයේ සිට මෙරට ඇති වූ කම්කරු වැඩවර්ජන 03 ක් ලියන්න.

(ii) පහත A.B.C සහ D වලින් දැක්වෙන තොරතුරුවලට අදාළ පිළිතුරු පිළිවෙළින් ලියා දක්වන්න.

A - මෙරට ආරම්භවූ ප්‍රථම බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමය

B - මහවැලි ගඟ කඩදොර නම් ස්ථානයෙන් වේල්ලක් බැඳ ඉදි කරන ලද ජලාශය

C - ක්‍රි.ව. 1960 පිහිටුවන ලද ප්‍රථම කාර්මික ජනපදය.

D - ක්‍රි.ව. 1972 ප්‍රථම සුළු අපනයන බෝග පර්යේෂණ මධ්‍යස්ථානය පිහිටවූ නගරය

(iii) බ්‍රිතාන්‍ය පාලනය යටතේ ශ්‍රී ලාංකික සමාජයේ සිදුවූ ආර්ථික හා සාමාජීය වෙනස්වීම් දෙකක් වෙන වෙනම විස්තර කරන්න.

(iv) නිදහසින් පසු මෙරට ව්‍යාපාරික කෘෂිකර්මාන්තය නගා සිටුවීම සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග තුනක් සැකෙවින් විස්තර කරන්න.

## III කොටස

10. (i) කාර්මික විප්ලවයත් සමග බිහි වූ නිර්මාණ තුනක් පහත දැක්වේ. ඒවායේ නිර්මාණකරුවන් A,B, හා C පිළිවෙලින් නම් කරන්න.

A - වාෂ්ප බලයෙන් ක්‍රියාකරන දුම්රිය එන්ජිම B - මෝටර් රථය C - විදුලි උදුන

(ii) කාර්මික විප්ලවය බ්‍රිතාන්‍යයෙන් ආරම්භ වීමට බලපෑ හේතු හතරක් සඳහන් කරන්න

(iii) සමාජ හා ආර්ථික ක්ෂේත්‍රයේ වෙනස්කම් ඇතිවීමට කාර්මික විප්ලවය හේතු වූ ආකාරය කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න.

(iv) ''පරිසර දූෂණය කාර්මික විප්ලවය නිසා ඇති වූ ප්‍රබල ම ගැටලුවකි'' නිදසුන් තුනක් ඉදිරිපත් කරමින් ඉහත ප්‍රකාශය පැහැදිලි කරන්න.

11. (i) පළමුවන ලෝක සංග්‍රාමයේ දී මධ්‍යම යුරෝපා බලවතුන්ගේ මිත්‍ර හවුලට අයත් රටවල් තුනක් වරහන් තුළින් තෝරා ලියන්න.

(බ්‍රිතාන්‍ය, බල්ගේරියාව, තුර්කිය, ප්‍රංශය, රුසියාව, ඔස්ට්‍රියාව, ජර්මනිය, ඉතාලිය)

(ii) පළමුවන ලෝක මහා සංග්‍රාමයට සම්බන්ධ පහත තොරතුරුවලට අදාළ පිළිතුරු A,B,C සහ D පිළිවෙලින් ලියා දක්වන්න.

A - ඇමෙරිකානු මඟීන් රැගත් නෞකාවක් ගිල්වා දැමුවේ කවුරුන් විසින් ද?

B - ඇල්සාස් හා ලොරේන් ප්‍රදේශ අයත් වූ රට කුමක්ද?

C - මධ්‍යම බලවතුන්ගේ පිලේ සිට රහස් ගිවිසුමක් මගින් මිත්‍ර පිලට එක් වූ රට

D - පළමුවන ලෝක යුද්ධයෙන් පසු නැවත ලෝක යුද්ධයක් ඇති වීම වැළැක්වීමට පිහිට වූ සංවිධානය කුමක් ද?

(iii) දෙවන ලෝක යුද්ධය කෙරෙහි ජර්මනිය හා ජපානයේ ක්‍රියාකලාපය බලපෑවේය. ඒ බව නිදසුන් 02 ක් ඇසුරින් පැහැදිලි කරන්න.

(iv) නැවත ලෝක යුද්ධයක් ඇතිවීම වළක්වාලමින් එක්සත් ජාතීන්ගේ සංවිධාන කටයුතු කර ඇති ආකාරය නිදසුන් 03ක් ඇසුරින් පැහැදිලි කරන්න.

12. (i) පුනරුද සමයේ බිහිවූ මානවවාදී ගත්කතුවරු තිදෙනෙක් නම් කරන්න.

(ii) පහත A.B.C සහ D වලින් දැක්වෙන තොරතුරුවලට අදාළ පිළිතුරු පිළිවෙළින් ලියා දක්වන්න.

A - පුනරුද සමයේ බිහි වූ අග්‍රගණ්‍ය ප්‍රතිමා ශිල්පියා

B - අත්හදා බැලීමේ පියා ලෙස විරුදාවලි ලැබූ විද්‍යාඥයා

C - පෘතුගාලයේ නාවික කටයුතු කෙරෙහි අනුග්‍රහයක් දැක්වූ පුද්ගලයා

D - ඉතාලියේ නව චිත්‍ර කලාවක් බිහි වූ මධ්‍යස්ථානය

(iii) කාර්මික විප්ලවය ශ්‍රී ලංකාවට බලපෑ ආකාරය කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න.

(iv) කාර්මික විප්ලවය නිසා ඇතිවූ සමාජ, ආර්ථික, හා දේශපාලන වෙනස්කම් එක බැගින් කෙටියෙන් පහදන්න.

13. (i) පහත A, B, C, වලින් දැක්වෙන තොරතුරු වලට අදාළ පිළිතුරු වරහන් තුළින් තෝරා අනුපිළිවෙලින් ලියා දක්වන්න.

A - කුඩා රාජ්‍යයන් කිහිපයක් එක් කර ජර්මනිය බිහි කිරීම.

B - සරයේවෝ නුවරදී ඝාතයට ලක් වූ ඔස්ට්‍රියාවේ ඔටුන්න හිමි කුමාරයා.

C - ජාතීන්ගේ සංගමය බිහි කිරීමට මූලිකත්වය ගෙන කටයුතු කිරීම.

(වින්ස්ටන් චර්චිල්, ෆ්‍රාන්ස් ෆර්ඩිනන්ඩ්, ඔටෝවෝන් බිස්මාර්ක්, වුඩ්රෝ විල්සන්)

(ii) පළමු ලෝක සංග්‍රාමය ඇති වීමට තුඩු දුන් හේතු 04 ක් ලියන්න.

(iii) ජාතීන්ගේ සංගමය අසාර්ථක වීමට බලපෑ හේතු 02 ක් දක්වා කෙටියෙන් විස්තර කරන්න.

(iv) එක්සත් ජාතීන්ගේ සංවිධානය ලෝක සාමය රැකීම සඳහා ගන්නා ලද ප්‍රයත්න 03 ක් නම් කර පැහැදිලි කරන්න.


N


ඉන්දියන් සාගරය
Indian Ocean
අප්‍රිකාව
Africa